(224)

පළාත් සැලසුම් චක්‍රලේඛ අංක - 2026/01

මගේ අංකය - NCP/CS/PD/D/04/PSDG/2026
ප්‍රධාන ලේකම් කාර්යාලය
උතුරු මැද පළාත.
දිනය - 2026/02/ 10

සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් වෙත.

**පළාත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා විධිමත් මෙහෙයුම්කරණය සඳහා මාර්ගෝපදේශ සහ උපදෙස්**

2026 වර්ෂයේ සිට අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම්කරණය, පහත සඳහන් අරමුණුවලට අවධානය යොමු කරමින් කටයුතු කිරීම අපේක්ෂා කරන අතර, එහිදී අනුගමනය කළයුතු උපදෙස් මෙම චක්‍රලේඛයට ඇතුළත් කර ඇත.

i. සංවර්ධන අවශ්‍යතා නිසි පරිදි ප්‍රමුඛතාගත කිරීම. (වාර්ෂික සහ මධ්‍යකාලීන ලෙස)
ii. අරමුදල් යෙදවීම හා වියදම් කිරීම කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීම.
iii. මානව සම්පත ඵලදායීව අදාල කාර්යයන්වල යෙදවීම.
iv. ඉටුකරනු ලබන ව්‍යාපෘතිවල විනිවිදභාවය උපරිම ලෙස පවත්වාගෙන යාම.
v. දේශීය හා විදේශීය මූල්‍ය මූලාශ්‍ර යටතේ පළාත තුළ පළාත් සභාව මගින් ක්‍රියාත්මක සියළුම සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම, ප්‍රගති සමාලෝචනය, ඇගයීම්කරණය හා මනා සම්බන්ධීකරණය පවත්වා ගෙන යෑම.

**(අ). ව්‍යාපෘති සැලසුම්කරණ ක්‍රියාවලිය.**

**01.** ජාතික සහ පළාත් සංවර්ධන ප්‍රමුඛතා සැලකිල්ලට ගනිමින් සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ FC/PDP/01/01/2026 අංක දරන 2025/10/07 දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2026 වාර්ෂික සංවර්ධන සැලැස්ම සැකසීමේ මාර්ගෝපදේශය (Guidelines for preparation of the Provincial Annual Development Plan) කෙරෙහි ද අවධානය යොමු කරමින් පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කළ යුතුය.

තවද, ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය සඳහා මේ වනවිට සකස් කර ඇති මධ්‍යකාලීන (තුන් අවුරුදු හෝ පස් අවුරුදු) සැලැස්මට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් වාර්ෂික සැලැස්ම හා ගලපා ඉදිරිපත් කිරීමට සැමවිටම කටයුතු කළ යුතුයි.

**02. මූලධන, පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පහත ක්‍රමවේද හා නිර්ණායක අනුගමනය කළයුතු වේ.**

i. 2025 වසරෙන් 2026 වසරට අතැති බිල්පත් සහ අවිච්ඡේද වියහැකි ව්‍යාපෘති වෙනුවෙන් මුදල් වෙන් කිරීමෙන් අනතුරුව පමණක් නව වැඩ විෂයයන් සඳහා ප්‍රතිපාදන වෙන්කළ යුතුය. හඳුනාගත් එම අවිච්ඡේද ව්‍යාපෘතිවල ඉතිරි වැඩ පළමු කාර්තුව තුල අවසන් කර ප්‍රජා අයිතියට පත් කල යුතුය. ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී, පෙර අඩක්/කොටසක් නිමකර ඇති ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

ii. 2026 වර්ෂය සඳහා සංවර්ධන ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් ප්‍රමුඛතාගත කිරීමේදී ඔබ විසින් 2025 වර්ෂයට ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති ලෙස ප්‍රමුඛතාගත කළ නමුත්, 2025 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

iii. 2026 වර්ෂයේ දී නව කාර්යාල ගොඩනැගිලි සඳහා සැලසුම් සකස් නොකළ යුතු අතර, අත්‍යවශ්‍යම වේ නම් පමණක් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමට මා වෙත ඉදිරිපත් කළ යුතුය.



Scanned with CamScanner

iv. වාර්ෂික වියදම් සැලැස්ම සකස් කළ යුතු අතර, එය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සමඟ අනුගත විය යුතුයි. සෑම ආයතනයක් /අංශයක් සඳහාම සියළු ව්‍යාපෘති ඇතුළත් වන පරිදි ක්‍රියාත්මක සැලැස්ම සකස් කළයුතු අතර, එය වර්ෂය මුලදීම මාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

v. තෝරා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති තිරසාර සංවර්ධන අරමුණු( SDG's), ජාතික ප්‍රතිපත්ති හා එක් එක් අංශයන්හි ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා නිකුත් කර ඇති අනෙකුත් විවිධ උපදෙස් සමඟ ගැළපිය යුතු ය.

vi. තෝරා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය වන්නා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව (TEC) නිවැරදිව ඇස්තමේන්තුගත වියයුතු අතර, අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීම සඳහා අමතර ප්‍රතිපාදන පසුව ඉල්ලා නොසිටීමට වගබලාගත යුතු ය. එක් වසරක් තුළ නිම නොවන සංවර්ධන ව්‍යාපෘති පැහැදිලිව සඳහන් කළ යුතු ය. 2026 වසර තුළ නිම නොවන ව්‍යාපෘතීන්හි මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු අතර, මුළු පිරිවැය ඇස්තමේන්තුව එක් එක් වසර අනුව 10% ක ප්‍රතිශතයකින් වැඩි කළ යුතු ය. ගිවිසුම් ගත විය යුත්තේ 2026 වසර තුළ අවසන් කළහැකි වැඩ ප්‍රමාණයට පමණක් වන අතර, ගිවිසුම වර්ෂයේ වැඩ/කාර්යයන් දෙසැම්බර් මස 25 දිනෙන් අවසන් විය යුතුය. වර්ෂය තුළ නිම කළ නොහැකි ව්‍යාපෘති සඳහා ගිවිසුම්ගත වන අවස්ථාවේදී ඉදිරි වර්ෂ සඳහා ප්‍රතිපාදන ලැබීම තහවුරු කර ගතයුතු අතර, ඒ පිළිබඳව ගිවිසුමට වගන්ති ඇතුළත් කළ යුතු ය. එමෙන්ම, සැලසුම් කිරීමේ දී වසර තුළ කෙරෙන ආයෝජනයේ ප්‍රතිලාභ ඉන් ඉක්බිති වසරේ සිට ලබා ගත හැකි පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම පිළිබඳව සැමවිටම අවධානය යොමු කළ යුතු ය.

vii. සංවර්ධන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී වැයකරනු ලබන මුදලට ප්‍රතිලාභ ලැබෙන පරිදි (Value for Money) අතිශයින් විචක්ෂණශීලීව කටයුතු කළයුතු අතර, සම්පත් අපතේයාම හා නාස්තිය අවම කරගත යුතුය. එසේම, කරනු ලබන සෑම ව්‍යාපෘති/ක්‍රියාකාරකමකටම අදාළ වූ අපේක්ෂිත ප්‍රතිඵල(ය) ලැබෙන බවට වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද යන්න, ආරම්භයේදීම හඳුනා ගතයුතු අතර, එක් එක් නිළධාරියා පෞද්ගලිකවම වගවීම පිළිබඳව වගකීම් පැවරිය යුතුය.

viii. කෘෂිකර්ම, සත්ත්ව පාලන, කුඩා කර්මාන්ත ආදී අංශ මඟින් හා ජීවනෝපාය සංවර්ධන, ස්වයංරැකියා ආදී ක්‍රියාත්මක කරනු ලබන ආදායම් උත්පාදන ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් සැබවින්ම ප්‍රමාණවත් ආදායම් උත්පාදනය කරන බවට පිරිවැය, ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුකර ඒ පිළිබඳව තහවුරුවක් ගෙන ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතුය. ප්‍රතිලාභී දායකත්වය අයකරනු ලබන මෙවැනි ව්‍යාපෘති බැංකු ආයතන සමඟ එක්ව ණය යෝජනා ක්‍රම මගින් විනිවිදභාවයෙන් හා තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා හැකි සැමවිටම කටයුතු කළ යුතුය.

ix. ලාභ ලැබීමේ අරමුණින් සිදුකරන ව්‍යාපාරික ස්වභාවයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එම ව්‍යාපෘතිවලට අදාළ සවිස්තරාත්මක හා ක්‍රමවත් ව්‍යාපාර සැලැස්මක් (Business Plan) සකස් කළයුතු අතර, ව්‍යාපෘතිය අනුමත කිරීමේදී අදාළ සැලැස්මද ඉදිරිපත් කළ යුතුය.

x. යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්ථානයේ ඉඩම නිරවුල් කර තිබිය යුතු වන අතර, සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියළු නිත්‍යානුකූල තත්වයන් සහ එකඟතාවයන් සම්පූර්ණ කර තිබිය යුතුය. (All Types of Clearance)

xi. තම අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගනු ලබන ව්‍යාපෘතිවල/ක්‍රියාකාරකම්වල ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම මඟින් ප්‍රමුඛතාගත කිරීම අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතුය. එසේම, ප්‍රමුඛතාගත කරන ලද ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සඳහා වෙන් වෙන්ව (මේ වනවිටත් හඳුන්වා දී ඇති) ශක්‍යතා වාර්තා ආකෘතියට අනුව විධිමත්ව සම්පූර්ණ කර අනුමැතිය සඳහා ආකෘති අංක 01 සමඟ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත නොපමාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. තවද, ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති/ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ අවශ්‍යතාවය මත සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තා ද සමඟ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් තවදුරටත් අවශ්‍ය පැහැදිලි කිරීම ඉල්ලා සිටිනු ලැබූ විට දී අවශ්‍ය පරිදි සකස් කර ඉදිරිපත් කළ යුතුය.



Scanned with CamScanner

xii. තම අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනයට ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය යොදා ගෙන ඉටු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති විස්තර ප්‍රමුඛතාවය අනුව පෙළගස්වා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත මීට අමුණා ඇති ආකෘති අංක 02 අනුව පිටපත් 03කින් දැනුම් දී, ප්‍රමුඛතාවය අනුපිළිවෙළට අවශ්‍ය ව්‍යාපෘති සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කරවා ගැනීමට කටයුතු කළ යුතු ය. එක් එක් අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට/ආයතනයට ලැබී ඇති ප්‍රතිපාදන ඉක්මවා ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම නොකළ යුතු අතර, එසේ ඉල්ලීම් ලැබෙන අවස්ථාවන්හි දී පෞද්ගලිකව මා දැනුවත් කළ යුතුය.

xiii. වැඩි වටිනාකම් සහිත ව්‍යාපෘති/ක්‍රියාකාරකම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා පළමුව යොමු කළයුතු අතර, අඩු වටිනාකම් සහිත ව්‍යාපෘති ඉන් පසුව යොමු කළ යුතුය. එසේ වුවද වර්ෂය අවසාන වනතෙක් ප්‍රමාද නොකොට කුඩා පරිමාණ ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

xiv. ඇස්තමේන්තු ලද විගස නියමිත ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර, ව්‍යාපෘති පිරිනැමීම සිදුකර, කඩිනමින් ව්‍යාපෘති අවසන් කළ යුතුය.

xv. සෑම අරමුදල් ප්‍රභවයකටම අදාළව ව්‍යාපෘති හඳුනාගැනීමේ මූලික අදියරේදී පළාතේ ජනතාව වෙත ප්‍රතිලාභ ලැබෙන, පළාතේ සංවර්ධනයට දායක කර ගත හැකි සහ පළාතේ නිෂ්පාදනය වැඩි කිරීමට දායක වන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

xvi. රේඛීය අමාත්‍යාංශවලින් ලබාදෙන ප්‍රතිපාදන හා වෙනත් මූල්‍ය ප්‍රභවයන් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය අවශ්‍ය නොවන බැවින්, එම ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර, ඉදිකිරීම් වලට අමතරව අනෙකුත් සියළුම ව්‍යාපෘති මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලද පසුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත යවා අනුමැතිය ලබා ගෙන වර්ෂය ආරම්භයේදීම ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

xvii. මුදල් කොමිෂන් සභාවේ අංක FC/ PDP/ 01/ 01/ 2025 - ii හා 2025.05.05 දිනැති ලිපියෙන් ග්‍රාමීය මට්ටමෙන් සිදු කරනු ලබන සෑම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් පිලිබඳව මහජනතාවට පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි ප්‍රමාණ පත්‍ර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය. සෑම ව්‍යාපෘතියක් ආරම්භයේදීම ව්‍යාපෘතියේ නම, ඇස්තමේන්තු වටිනාකම, ක්‍රියාත්මක කරනු ලබන ආයතනය, කොන්ත්‍රාත්කරු වැනි තොරතුරු ඇතුළත් නාම පුවරුවක් ස්ථාපණය කළ යුතුය.

03. 2026 වර්ෂයේ සියළු සංවර්ධන ව්‍යාපෘති / ක්‍රියාකාරකම් පිළිබඳව මෙහෙයුම්කරණ ක්‍රියාවලිය 2026.02.10 දිනැති මෙම පළාත් සැලසුම් චක්‍රලේඛ අංක 2026/01 ට අනුව නොකඩවා සිදු කළ යුතුය. පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් සංවර්ධන ව්‍යාපෘති මෙහෙයුම් පද්ධතිය (DPMS) මගින් ප්‍රගතිය වාර්තා කිරීම කළ යුතු අතර, ඒ සඳහා වගකිවයුතු නිලධාරියෙකු වෙත වගකීම පවරා මා වෙත වාර්තා කළ යුතුය.

**(ආ). ව්‍යාපෘති / ක්‍රියාකාරකම් මෙහෙයුම්කරණය සහ ඇගයීමේ ක්‍රියාවලිය.**

සාමූහික ප්‍රදාන (BG), පළාත් සභා සංවර්ධන ප්‍රදාන (PCDG), පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සහ ලෝක බැංකු ආධාර යනාදී අරමුදල් ප්‍රභවයන් යටතේ සංවර්ධන ව්‍යාපෘතීන් උතුරු මැද පළාත් සභාවේ විවිධ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම සියළු සංවර්ධන ව්‍යාපෘති / ක්‍රියාකාරකම් මෙහෙයුම්කරණය පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

ඒ අනුව, ඉදිරියේදී වාර්ෂික සංවර්ධන සැලැස්ම ප්‍රගති සමාලෝචනයේදී පහත උපදෙස් අනුගමනය කරන ලෙස මෙයින් දන්වමි.

**04. පහත ආකාරයෙන් තම ආයතනවල වාර්ෂික සංවර්ධන සැලැස්මේ ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා රැස්වීම් පැවැත්වීම අනිවාර්යය වේ.**

4.1.1 දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම, සෑම මසකම 06 වන දිනට පෙර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කිරීම.
(සංවිධානය - අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසිනි)



Scanned with CamScanner

4.1.2 අමාත්‍යාංශ මට්ටමේ ප්‍රගතිය සාකච්ජා කිරීම සෑම මසකම 10 වන දිනට ප්‍රථම අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අමාත්‍යාංශයේ ගණකාධිකාරී, අධ්‍යක්ෂ/නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) යන අයගේ සහභාගිත්වයෙන් සිදු කිරීම.

(සංවිධානය - අධ්‍යක්ෂ/ නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) විසිනි)

එසේම, රැස්වීම් වාර්තාව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත ඉදිරිපත් කළ යුතුය.

4.1.3 පළාත් සභා මට්ටමේ ප්‍රගතිය සාකච්ජා කිරීම සෑම මසකම 15 දිනට ප්‍රථම ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/මුදල්/ඉංජිනේරු), අමාත්‍යාංශ ලේකම්වරුන්,, අධ්‍යක්ෂ/නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන), ගණකාධිකාරී හා අදාළ වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් යන අයගේ සහභාගිත්වයෙන් සිදු කිරීම.

( සංවිධානය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසිනි)

4.1.4 අමාත්‍යාංශයක් යටතට නොවන ආයතනයක ප්‍රගතිය සාකච්ජා කිරීම ප්‍රධාන ලේකම් විසින් කැඳවන අවස්ථාවකදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ මුදල්/ ඉංජිනේරු), ආයතන ප්‍රධානී, ගණකාධිකාරී, විෂයභාර නිලධාරීන් යන අයගේ සහභාගිත්වයෙන් සිදු කිරීම.

(සංවිධානය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසිනි).

4.2. පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද වාර්ෂික සංවර්ධන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සම්බන්ධ සියළු තොරතුරු පළාත් සංවර්ධන සැලසුම් මෙහෙයුම් පද්ධතියට (DPMS) ඇතුලත් කිරීම අනිවාර්ය වන අතර, ඒ සම්බන්ධයෙන් වගකීම, අවධානය සහ නිරන්තර අධීක්ෂණය අමාත්‍යාංශ ලේකම් හෝ අමාත්‍යාංශයක් යටතට නොවන ආයතනයක් වේ නම් එහි ප්‍රධානියා වෙත මෙයින් බලය පවරා දෙන අතර, පහත සඳහන් කරුණු කෙරෙහිද අවධානය යොමු කළ යුතුය.

4.2.1 වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්කරණ පද්ධතිය යාවත්කාලීන කිරීම පිළිබඳ නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතුය.

4.2.2 උක්ත අරමුදල් ප්‍රභවයන් යටතේ අනුමත කරන ලද සියළුම සංවර්ධන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් මෙම පද්ධතියට ඇතුලත් කර ඇති බව තහවුරු කරගත යුතුය.

4.2.3 මාසිකව ව්‍යාපෘතියේ/ක්‍රියාකාරකමෙහි මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය යාවත්කාලීන කරන බව එහිදී තහවුරු කර ගත යුතුය.

4.2.4 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ලබා ගැනීම මෙන් ම මාසයකට වරක් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම, මෙම පද්ධතියට ඇතුලත් කරනු ලබන දත්ත මගින් සිදු කරනු ලැබිය යුතුය.

05. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී වාර්ෂික සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කළ යුතු අතර, අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් තම අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු පිළිබඳව විස්තරාත්මක ප්‍රගතිය ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුය.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ.
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.



Scanned with CamScanner